ප්‍රලේඛ සංග්‍රහය

උ. ප. 3

# කෘෂිකාර්මික ගෘහ ඒකක පිළිබඳ සමීක්ෂණය – 1987/88

ජාතික ගෘහ ඒකක නියැදි සමීක්ෂණ
වැඩ සටහන

වී නිෂ්පාදන වියදම් උපලේඛනය
පිරවීම පිළිබඳ උපදෙස්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

# වී නිෂ්පාදන වියදම් සමීක්ෂණය

## හැඳින්වීම

කුරුණෑගල, පොළොන්නරුව, අම්පාර, මහනුවර, රත්නපුරය, කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්කයන්හි වී නිෂ්පාදන වියදම් ඇස්තමේන්තු කිරීම සඳහා මෙම සමීක්ෂණය සැළසුම් කරන ලදී. 1988 පෙබරවාරි මාසයෙන් ආරම්භ වූ 'කෘෂිකාර්මික ගෘහ ඒකක පිළිබඳ සමීක්ෂණය - 1987/88' හි ම කොටසක් ලෙස මෙම සමීක්ෂණය පවත්වනු ලැබේ. මෙම සමීක්ෂණයේ තොරතුරු එක්රැස් කිරීම 1988 ජූලි මස අග භාගයේදී ආරම්භ කෙරෙනු ලැබේ.

කෘෂිකාර්මික ගෘහ ඒකක පිළිබඳ සමීක්ෂණයේ සෑම වටයකදීම වී අස්වනු නෙළීමට ආසන්න කුඹුරු කැබලි සහිත ගෘහ ඒකක හඳුනාගන්නා ලදී. ඒ ඒ වටයන් සඳහා එසේ හඳුනාගත් සෑම කුඹුරු කැබැල්ලක්ම යොදාගනිමින් මෙම සමීක්ෂණය පැවැත්වෙනු ඇත.

අදාල දිස්ත්‍රික්කයන්හි සංඛ්‍යාලේඛන විමර්ශකවරුන් මේ සමීක්ෂණය කිරීමට තෝරාගනු කෙරුණු ගෘහ ඒකකයන්ට ගොස්, අවසාන වරට වී අස්වනු නෙලාගත් කන්නයේ වගා කරන ලද බිම් කැබලිවලට අදාලව තොරතුරු එක්රැස් කරනු ඇත. (එක් බිම් කැබැල්ලක් සඳහා එක් උපලේඛනයක් බැගින් පිරවිය යුතුයි.)

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් වී නිෂ්පාදන වියදම් සමීක්ෂණයක් පවත්වනු ලබන ප්‍රථම වතාව මෙය වන අතර මෙහි සාර්ථකත්වය සඳහා සෙසු නිලධාරීන්ගෙන් ලැබෙන සහයෝගය ඉතා වැදගත් වේ.

## වී නිෂ්පාදන වියදම් උපලේඛනය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්.

1. යම් ගෘහ ඒකකයක සාමාජිකයකු/සාමාජිකයන් විසින් අවසාන වරට වගාකර අස්වැන්න නෙළාගත් සෑම බිම් කැබැල්ලක් සඳහා වී නිෂ්පාදන වියදම් උපලේඛනය (සීපී-1) බැගින් සම්පූර්ණ කළ යුතු වේ. යම් අස්වැද්දූම් බිම් කැබැල්ලක් වගා කලත් විශේෂ හේතුවක් නිසා අස්වැන්න කපා නොගත්තේ නම් එවැනි බිම් කැබලි සඳහා සීපී-1 උපලේඛනය සම්පූර්ණ නොකළ යුතුය.

වී නිෂ්පාදන වියදම් උපලේඛනයක් (සීපී-1) සඳහා යම් කැබැල්ලක් සඳහා විස්තර ඇතුලත් කළ යුතු වන්නේ එම කැබැල්ලේ මූලික කාර්යයන් වන තවාන් සකස් කිරීම හා/හෝ බිම් සකස් කිරීම අවස්ථාවේ සිට අස්වැන්න නෙළාගෙන ඒවා ගෙදරට ගෙන ඒම හෝ ගබඩා කිරීම යන අවස්ථාව තෙක් කරන වියදම් පමණකි. හවුලේ කරන වගාවක් නම් හවුල්කරු විසින් දරණ ලද වියදම් කොටසද මෙහි ඇතුලත් කළ යුතු වේ.

සීපී-1 උපලේඛනයේ 1 සහ 2 කොටස් යටතේ සියලුම තොරතුරු සැපයිය යුත්තේ අවසාන වරට අස්වැන්න නෙළාගත් කන්නයට අදාලවය. මෙහිදී, අවසන් වරට අස්වැන්න නෙළාගත් කන්නය, සහ පසුගිය වගා කන්නය අතර වෙනස පැහැදිලිව අවබෝධ කර ගැනීම ඉතා වැදගත්ය. පසුගිය වගා කන්නය යනු අදාළ දිස්ත්‍රික්කය තුළ මේ වන විට අවසන් වී ඇති කන්නය වේ. නමුත් අවසන් වරට අස්වැන්න නෙළාගත් කන්නය යනු, මෙම බිම් කැබැල්ල අන්තිම වතාවට වගාකර අස්වැන්න නෙළාගත් කන්නය වේ.

2. හඳුනාගැනීමේ තොරතුරු.

යම් ගෘහ ඒකකයක් සඳහා ඔබ කෘෂිකාර්මික ගෘහ ඒකක පිළිබඳ සමීක්ෂණ උපලේඛනයේ "හඳුනාගැනීමේ තොරතුරු" යටතේ සඳහන් කළ සියළුම විස්තර, සීපී-1 උපලේඛනයේ හඳුනාගැනීමේ තොරතුරු යටතේද සඳහන් කළ යුතු වේ. සමීක්ෂණ උපලේඛනයේ සපයන ලද විස්තර වලට අමතර වූ පහත සඳහන් විස්තර ඔබ විසින් සීපී-1 උපලේඛන පිරවීමේදී ඇතුලත් කළ යුතුය.

(I) ප්‍රතිචාරකයාගේ නම - එනම් මෙම තොරතුරු සපයු තැනැත්තාගේ නම

(II) කාරකයාගේ නම - එනම් කුඹුර වගා වැඩ කටයුතු කළ පුද්ගලයාගේ නම

### 1 වන කොටස.

#### 1. අවසාන වරට අස්වැන්න නෙළාගත් කන්නය.

අවසාන වරට අස්වැන්න නෙළාගත් කන්නයට අදාළ කේතය කව කරන්න. යම් හෙයකින් අස්වැන්න නෙළාගත් කන්නය වනුයේ අන්තර් කන්නයක් හෝ 1988 යල කන්නයට ප්‍රථම කන්නයක් නම් එය වෙනත් යටතේ සඳහන් කර කේතය කව කරන්න.

#### 2. අස්වැන්න නෙළාගත් බිම් කැබැල්ලේ ප්‍රමාණය.

මෙහිදී සඳහන් කළ යුත්තේ ඔබ මෙම කැබැල්ල වගා කරන ලද ගෘහ ඒකකය විසින් සමීක්ෂණ උපලේඛනයේ පිටකවරයේ සඳහන් කළ බිම් කැබැල්ලේ, අවසාන වරට අස්වැන්න නෙළාගත් කන්නයේදී, වී වගා කර තිබූ බිම් ප්‍රමාණය වේ.

පහත සඳහන් නිදසුන බලන්න :

යම් ගෘහ ඒකකයක් සඳහා සම්පූර්ණ කරන ලද සමීක්ෂණ උපලේඛනයේ පිට කවරයේ වී වගාව යටතේ වූ බිම් කැබැල්ලේ ප්‍රමාණය අක්කර 1 ක් බව දක්වා ඇතැයි සිතමු. එහෙත් ඔබ, සීපී-1 සම්පූර්ණ කිරීමට යන අවස්ථාව වන විට එම කැබැල්ලෙන් යම් හේතුවක් නිසා අස්වැන්න නෙලාගෙන ඇත්තේ අක්කර 3/4 ක් පමණක් නම් ඔබ, බිම් කැබැල්ලේ ප්‍රමාණය ලෙස සඳහන් කළ යුත්තේ අක්කර 3/4 ක් පමණි. මෙය පහත සඳහන් ලෙස පිරවිය යුතුය.

| අ. | රූ. | ප. |
|---|---|---|
| - | 3 | - |

(අක්කර 3/4 ක් යනු රූඩ් 3 යි)

3. <u>බීජ වර්ගයේ නම.</u>

මෙහිදී භාවිතා කළ වී වර්ගය කුමක්දැයි විමසා දී ඇති තිත් පේළි මත සටහන් කර එය පාරම්පරික වී වර්ගයක්ද, වැඩි දියුණු කළ වී වර්ගයක්දැයි නිගමනය කොට, ඊට අදාළ කේතය කව කළ යුතුය. පාරම්පරික වී යනු ගොවියන් විසින්ම බීජ වී වශයෙන් තබාගෙන, ඉතා ඈත කාලයේ පටන් වගා කරන හීනටි, කළු වී, හාතියල්, මා වී ආදී වී වර්ගයන්ය. වී පර්යේෂණායතනයන්හි බද්ධ කිරීමෙන් නිපදවූ අළුත් වී වර්ග - එනම් බී.ජී.11, එච් 4 ආදිය වැඩි දියුණු කළ වී වර්ගයන්ය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් බෙදා හරිනු ලබන්නේ මෙම වැඩි දියුණු කළ වී වර්ගයන්ය.

4. <u>වාරිමාර්ග ක්‍රමය.</u>

මෙහිදී සඳහන් කළ යුත්තේ බිම් කැබැල්ලට ජලය සැපයුනු ක්‍රමය වේ. විශාල වාරිමාර්ග වලින් ජලය සපයන ලද්දේ නම් කේත අංක 1 ද, සුළු වාරිමාර්ග ක්‍රම වලින් ජලය සපයන ලද්දේ නම් කේත අංක 2 ද, වර්ෂා ජලයෙන් වගා කටයුතු කරන ලද්දේ නම් කේත අංක 3 ද කව කරන්න.

විශාල වාරිමාර්ග යටතේ ගැනෙනුයේ අක්කර 200 කට වැඩි බිම් ප්‍රමාණයකට ජලය සැපයෙන වාරිමාර්ග ක්‍රමයන්ය. අක්කර 200 ට අඩු ප්‍රමාණයකට ජලය සැපයෙන වාරිමාර්ග ක්‍රම සුළු වාරිමාර්ග යටතේ ගැනේ.

උඤ්සත වාරිමාර්ග ක්‍රම භාවිතා කරන අවස්ථාවලදී ඒවා ද ඉහත සඳහන් ලෙස විශාල හෝ සුළු වාරිමාර්ග යටතට ඇතුලත් කරන්න.

5. <u>වගා කළ ක්‍රමය.</u>

සකස් කරගත් කුඹුරක් වගා කරන ලද ක්‍රමයට අදාළ කේතය කව කරන්න.

| | |
|---|---|
| වැපිරීම - 1 | පැළ සිටුවීම - 2 |
| බීජ පේළියට දැමීම - 3 | වෙනත් (සඳහන් කරන්න) - 4 |

මෙහිදී කේත අංක 4 හා ව ෴රන ලද්දේ නම් භාවිතා කළ ක්‍රමය සඳහන් කළ යුතු වේ. මෙහිදී කේත එකකට වඩා කව කර තිබිය හැකිය.

6. භාවිතා කළ පොහොර.

වී වගාවේ විවිධ අවස්ථාවන්හිදී පොහොර යොදනු ලැබේ. බීජ වැපිරීමට පෙර එක් පොහොර වර්ගයක් ද, පැල වැඩෙන කාලයට තවත් පොහොර වර්ගයක් ද, වැඩුනු පසු හා එල දරන කාලයට වෙනත් පොහොර වර්ග ද ආදී වශයෙන් විවිධ පොහොර වර්ග යොදනු ලැබේ. මේ සෑම පොහොර වර්ගයක් සඳහාම අදාළ කේතය කව කරන්න. මෙහිදී 1 සිට 6 දක්වා කේත අංක අතුරින් එකකට වඩා කවකර තිබිය හැක. කිසිම පොහොර වර්ගයක් භාවිතා නොකරයි නම් කේත අංක 7 කව කරන්න.

7. වල් පැළෑටි මර්දන ක්‍රමය.

වී වගාවේදී විවිධාකාර වල් පැළෑටි මර්දන ක්‍රම යොදා ගැනේ. බොහෝ විට එකම වගාවේ විවිධ අවස්ථාවන්හිදී ඇතිවන වල් පැළෑටි මර්දනය සඳහා විවිධ ක්‍රම භාවිතා කරති. මේ සියල්ල ප්‍රධාන ක්‍රම හතරක් යටතේ වර්ග කළ හැකිය. එනම් වල් පැළෑටි අතින් ඉදිරීම, ජලයට යටකොට කුණුවීමට හැරීම, රසායනික ද්‍රව්‍යය භාවිතයෙන් වල් පැල විනාශ කිරීම සහ යාන්ත්‍රික ක්‍රම වශයෙනි. ඊට වෙනස් ක්‍රමයක් නම් සඳහන් කරන්න. කිසියම් ක්‍රමයක් භාවිතා නොකරයි නම් කේත අංක 6 කව කරන්න. ඒවා සඳහා පහත සඳහන් පරිදි කේත යොදා ඇත. අදාල කේත කව කරන්න.

මෙහිදී 1 සිට 5 දක්වා කේත අතුරින් එකකට වඩා තිබිය හැක -

| | | | |
|---|---|---|---|
| අතින් වල්පැළෑටි ඉදිරීම | - 1 | රසායනික ක්‍රම | - 3 |
| ජලය භාවිතයෙන් | - 2 | යාන්ත්‍රික ක්‍රම | - 4 |

| | |
|---|---|
| වෙනත් (සඳහන් කරන්න) | - 5 |
| භාවිතා නොකරයි | - 6 |

8. ජල පහසුකම්.

වගාවේ ජල පහසුකම් සම්බන්ධව මෙහිදී සඳහන් කළ යුතු වේ. එම ප්‍රදේශයේ ඇත්තේ විශාල වාරිමාර්ග හෝ සුළු වාරිමාර්ග ක්‍රමයක් නම් වගාවට ලැබුනු ජලය ප්‍රමාණයට වඩා වැඩිද, ප්‍රමාණවත්ද, කොටසකට පමණක් සෑහේද, කිසිසේත් ප්‍රමාණවත් නොවීද, බෙදාහැරීමක් තැද්ද හෝ වෙනත් හේතුවක් දැයි දැනගෙන අදාළ කේතය කව කරන්න. වගාකළේ වර්ෂා ජලයෙන් නම් එම ජලය ප්‍රමාණයට වඩා වැඩිද, ප්‍රමාණවත්ද, කිසිසේත් ප්‍රමාණවත් නොවීද යන කේත අංක වලින් අදාල කේතය කව කරන්න. වෙනත් යටතේ ඇතුලත් වන්නේ ජලය බෙදාහැරීමක් තිබුනත් යම් යම් පුද්ගලයින්ගේ හෝ වෙනත් හේතු නිසා ඇතිවුනු අවහිර බාධා ආදියයි.

9. වගාවට රෝග වැළඳුනේද ?

වී වගාවට රෝග වැළඳුනේද ? ඔව් නම් 1 ද නැත නම් 2 ද කව කරන්න. අංක 1 කව කළේ නම් ප්‍රතිකර්ම කළේද යැයි අසා දැනගෙන ඔව් නම් 1 ද නැත නම් 2 ද කව කරන්න.

10. කෘමි/දිලීර නාශක ක්‍රමය.

වී වගාවට හානි කරන කෘමීන් සහ දිලීර විනාශ කිරීම සඳහා විවිධ ක්‍රම භාවිතා කරනු ලැබේ. මෙහිදී කෘමීන්/දිලීර මර්දනය කළේ නම් එසේ කළ ක්‍රමයට අදාළ කේතය කව කරන්න. එනම් කෘමි/දිලීර නාශක භාවිතා කළේ නම් කේත අංක 1 ද, වෙනත් ක්‍රම වලින් නම් කේත 2 ද කිසිවක් භාවිතා නොකරයි නම් කේත 3 ද වේ. මෙහිදී 1 සහ 2 කේත අතුරින් එකකට වඩා තිබිය හැකිය.

**2 වන කොටස :**

වී වගා කිරීමේදී කළ යුතු කාර්යයන් වන පැල තවාන් කිරීම හා බලාගැනීම, බිම සකස් කිරීම, වැපිරීම හා පැල සිටුවීම, පොහොර යෙදීම, වල් පැලෑටි මර්ධනය, කෘමි/දිලීර නාශක යෙදීම, ජල සැපයුම, කුරුල්ලන්ගෙන් හා සතුන්ගෙන් ආරක්ෂා කිරීම, අස්වනු නෙලීම හා ගොවිපලේ අමතර වියදම් පිළිබඳ විස්තර මෙම කොටසේදී සම්පූර්ණ කළ යුතුය. ඒ සඳහා ද්‍රව්‍ය, මෙවලම් හා උපකරණ සහ ශ්‍රමය යන ප්‍රධාන ශීර්ෂ තුනක් යටතේ තීර අංක 2 සිට තීර අංක 29 දක්වා වූ තීරයන් වෙන්කර ඇති අතර එක් එක් කාර්යයට අදාල විස්තර ඒ ඒ ශීර්ෂ හා තීර අනුව ඇතුලත් කළ යුතුය. මෙහිදී තීර අංක 2 සිට තීර අංක 4 දක්වා තීර ද්‍රව්‍ය සඳහා ද, තීර අංක 5 සිට තීර අංක 7 දක්වා මෙවලම් හා උපකරණ ද, තීර අංක 8 සිට 29 දක්වා ශ්‍රමය ද වෙනුවෙන් ප්‍රධාන ශීර්ෂ තුන වෙන් කර ඇත.

**තීර අංක 2,3,4 - ද්‍රව්‍යය.**

මෙහිදී ද්‍රව්‍යය ලෙස පහත සඳහන් දෑ ගැනෙනු ඇත. බීජ වී, පැල, පොහොර (රසායනික සහ කාබනික), වල් නාශක, කෘමි නාශක, දිලීර නාශක ආදී කෘෂි රසායනික, ඉන්ධන වර්ග හා රතිඤ්ඤා, වෙඩි බෙහෙත් ආදියයි.

**තීර අංක 2 - ප්‍රමාණය.**

මෙහි සඳහන් කළ යුත්තේ අදාළ කාර්යය සඳහා භාවිතා කළ ද්‍රව්‍යය ප්‍රමාණය හා ඒකකය වේ. නිදසුනක් ලෙස මෙම උපලේඛනයේ 2.9 - පොහොර යෙදීම කාර්ය සලකන්න. මෙහි 'පොහොර' ඉදිරියේ යෙදූ පොහොර ප්‍රමාණය සහ ඒකකය සඳහන් කළ යුතුය. ප්‍රමාණය දශමස්ථාන දෙකකින් දක්වන්න.

**තීර අංක 3 -**

මෙහි සඳහන් කළ යුත්තේ එම ද්‍රව්‍යය ලබාගත් ආකාරයට අදාළ කේතයයි. මිළදී ගත්තේ නම් කේත අංක 1 ද, වෙනත් ආකාරයකින් නම් කේත අංක 2 ද වේ. වෙනත් ආකාරයකින් යනු නයට/ඉල්ලාගත්, නොමිලේ ලැබුණු, සහනාධාර යටතේ ලැබුණු, තමාගේම දෑ යොදා ගැනීම ආදිය වේ.

**තීර අංක 4 - මිළදී ගත්තේ නම් වියදම.**

මෙහි සඳහන් කළ යුත්තේ එම ද්‍රව්‍යය මිළදී ගත්තේ නම් ඒ සඳහා වියදම් වූ මුදලය. ඔබ තීරු අංක 2 හි සඳහන් කළ ප්‍රමාණය මිළදී ගැනීම සඳහා ඔබට වැය වූ මුදල රුපියල් වලින් මෙහිදී සඳහන් කරන්න.

**තීර අංක 5,6,7 - මෙවලම් සහ උපකරණ.**

ට්‍රැක්ටර් රෝද 4/රෝද 2 සහ වල් නාශක, කෘමි නාශක, දිලීර නාශක ආදී රසායනික වර්ග ඉසීමට භාවිතා කරන යන්ත්‍ර (දිලීර රසින යන්ත්‍ර), ගොයම් කපන යන්ත්‍ර, වී ගොයමින් වෙන් කරන යන්ත්‍ර, වී හුලංකරන යන්ත්‍ර, වතුර පොම්ප, ස්ප්‍රේයර් ආදී උපකරණ මෙම තීර අංක 5,6,7 යටතේ ගැනේ.

මෙයට අමතරව මඩ කිරීම, සී සෑම, ගොයම් පෑගීම ආදියට යොදා ගනු ලැබූ හරක්/මීහරක් ආදී සතුන් සඳහා දැරූ වියදම ද උපකරණ සහ මෙවලම් යටතේම සඳහන් කළ යුතුය.

<u>තීර අංක 5 - යොදාගත් අයිතම ගණන.</u>

මෙම තීරුව යටතේ අදාල කාර්යයට යොදාගත් අයිතම සංඛ්‍යාව සඳහන් කළ යුතුය. නිදසුනක් ලෙස 2.3 - පළමු සීසෑම සළකන්න. මෙහිදී යොදාගනු ලැබුවේ රෝද 2 ට්‍රැක්ටර් 1 ක් නම් 2.3 - පළමු සීසෑම යටතේ පළමු තීරයේ ට්‍රැක්ටර් රෝද 4/රෝද 2 ඉදිරියෙන් තීරු අංක 5 හි අයිතම ගණන යටතේ '1' යැයි සඳහන් කළ යුතුය.

එහිදී යොදාගත්තේ මීහරකුන් 2 ක් නම් පළමු තීරයේ එය 2.3 - පළමු සීසෑමෙහි සතුන් යටතේ 5 වන තීරුවේ අයිතම ගණන යටතේ '2' යැයි සඳහන් කළ යුතුය.

<u>තීර අංක 6 - ලබාගත් ආකාරය.</u>

6 වන තීරය යටතේ දැක්විය යුත්තේ එකී මෙවලම් සහ උපකරණ ලබාගත් ආකාරයට අදාළ කේත අංකයයි. කුලියට ගත්තේ නම් කේත අංක 1 ද, වෙනත් ආකාරයකින් නම් කේත අංක 2 ද වේ. වෙනත් ආකාරයකින් යනු ණයට/ඉල්ලා ගත්, නොමිළයේ ලැබුණු, තමා සතුවූ දේම යොදාගැනීම ආදිය වේ.

<u>තීර අංක 7 - කුලියට ගත්තේ නම් කුලිය සඳහන් කරන්න.</u>

මෙම තීරයේ සඳහන් කළ යුත්තේ, කුලියට ගත්තේ නම් ගෙවූ මිළය. එය රුපියල් වලින් දෙන්න.

<u>තීර අංක 8 - 29 : ශ්‍රමය.</u>

ශ්‍රමය පිළිබඳ විස්තර ප්‍රධාන උප ශ්‍රේණි 3 ක් යටතේ රැස් කෙරේ. එනම් ගෘහ ඒකක ශ්‍රමය අත්තම් ශ්‍රමයද ඇතුළුව, කුලියට ගත් ශ්‍රමය සහ දැනට පවතින දෛනික වැටුප කෑම රහිතව යනාදිය වේ.

<u>තීර අංක 8 - 16 : ගෘහ ඒකක ශ්‍රමය.</u>

ගෘහ ඒකක ශ්‍රමය ලෙස සැලකෙන්නේ අදාළ කාර්යය සඳහා දායකවන නමුත් වැටුපක් නොලබන ගෘහ ඒකකයේ සාමාජිකයින්ගේ ශ්‍රමය හා අත්තම් ශ්‍රමය වේ. මෙම කොටස යටතේ සාමාන්‍යයෙන් දිනකට වැඩ කළ මිනිසුන් ගණන, සාමාන්‍යයෙන් දිනකට වැඩ කළ පැය ගණන හා වැඩ කළ දින ගණන යනුවෙන් කොටස් තුනක් යටතේ පිරිමි, ගැහැණු සහ ළමයි වෙනුවෙන් වෙන් වශයෙන් විස්තර සැපයිය යුතුයි.

<u>තීර අංක 17 - 25 : කුලියට ගත් ශ්‍රමය.</u>

කුලියට ගත් ශ්‍රමය ලෙස සැලකෙන්නේ අදාළ කාර්යය සඳහා දායක වෙමින් ඒ සඳහා වැටුපක්/වේතනයක්, මුදල්මය හා/හෝ ද්‍රව්‍යමය වශයෙන් ලැබීමක් ලබන ශ්‍රමය වේ. මාසිකව වැටුප් ලබන ස්ථිර/අනියම් සේවකයින්ද වෙතොත් ඔවුන්ගේ ශ්‍රමයද මෙයට ඇතුලත් විය යුතු බව සැළකිය යුතුය.

මෙම කොටස යටතේද සාමාන්‍යයෙන් දිනකට වැඩ කළ මිනිසුන් ගණන, සාමාන්‍යයෙන් දිනකට වැඩ කළ පැය ගණන හා වැඩ කළ දින ගණන යනුවෙන් කොටස් තුනක් යටතේ පිරිමි, ගැහැණු, ළමුන් වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් විස්තර සැපයිය යුතුයි. පහත සඳහන් නිදසුනෙන් තීර අංක 8 – 25 දක්වා සම්පූර්ණ කළ යුතු ආකාරය පැහැදිලි කරගත හැකිය.

නිදසුනක් වශයෙන් අස්වනු නෙලීමේ කාර්යය සළකන්න. ගොයම් කැපීම සඳහා <u>ගෘහ ඒකක ශ්‍රමය අත්තම් ශ්‍රමය යටතේ</u> පළමු දවසේ ගැහැණුන් 3 ක් සහ මිනිසුන් 2 ක් පැය 5 ක් පමණද, දෙවන දවසේ ගැහැණු 3 දෙනා පමණක් පැය 4 ක් පමණ ද වැඩ කළේයැයි සිතමු. එවිට –

| | | | |
|---|---|---|---|
| සාමාන්‍යයෙන් දිනකට වැඩ කළ මිනිසුන් ගණන | පිරිමි | 2 | (තීරු අංක 8) |
| | ගැහැණු | 3 | (තීරු අංක 9) |
| සාමාන්‍යයෙන් දිනකට වැඩ කළ පැය ගණන | පිරිමි | 5 | (තීරු අංක 11) |
| | ගැහැණු | $\frac{5 + 4}{2} = 4\ 1/2$ | (තීරු අංක 12) |
| වැඩ කළ දින ගණන | පිරිමි | දින 1 | (තීරු අංක 14) |
| | ගැහැණු | දින 2 | (තීරු අංක 15) |

ඉහත නිදසුනේ යොදාගත්තේ කුලියට ගත් ශ්‍රමය නම් තීර 17 – 25 දක්වා අදාල තීර පුරවන්න.

<u>තීර අංක 26 – 28 දක්වා – දැනට පවතින දෛනික වැටුප කෑම රහිතව.</u>

යම් කාර්යයක් සඳහා සාමාන්‍යයෙන් ආහාර නොමැතිව එක් පුද්ගලයෙකුට දිනකට එම ප්‍රදේශයේ ගෙවනු ලබන මුදල මෙහිදී සඳහන් කළ යුතු වේ. පිරිමි, ගැහැණු සහ ළමුන්ට ගෙවන ලද අගයන් වෙන් වශයෙන් සඳහන් කළ යුතුය.

<u>තීර අංක 29 – කොන්ත්‍රාත් ශ්‍රමය සඳහා වියදම්.</u>

මෙහිදී කොන්ත්‍රාත් ශ්‍රමය සඳහා වියදම් සඳහන් කළ යුතුය. යම් කාර්යයක් කොන්ත්‍රාත් ක්‍රමයට සිදුකරන ලද්දේ නම් ඒ සඳහා ගෙවූ මුදල රුපියල් වලින් සඳහන් කරන්න.

නිදසුනක් ලෙස බීජ් සැකසීම කොන්ත්‍රාත් ක්‍රමයට සිදු කරන ලද්දේ නම් ඒ සඳහා ගෙවූ මුළු මුදල රුපියල් වශයෙන් දක්වන්න. කොන්ත්‍රාත් ක්‍රමයට ගෙවූ මුදල සටහන් කරන විට එම කාර්යය සඳහා තීර අංක 2 සිට 28 දක්වා පිරවිය යුතු නොවේ. (එසේ කළහොත් එම මුදල දෙවතාවක් සටහන් වන නිසා ඇතුලත් නොකළ යුතුය.)

<u>තීර අංක 1 යටතේ සඳහන් කර ඇති කාර්යයන් පිළිබඳව සැපයිය යුතු තොරතුරු පහත විස්තර කර තිබේ.</u>

1. <u>තවාන් සකස් කිරීම සහ බලාගැනීම.</u>

වී වගාවක දී අවශ්‍ය වන පැල ලබා ගත්තේ තමා විසින්ම සකස් කරන ලද පැල තවානකින් නම් එම පැල තවාන් සකස් කිරීම හා බලාගැනීම පිළිබඳ විස්තර මෙහි ඇතුලත් කළ යුතුය.

<u>සැ.ළකිය යුතුයි</u> : යම් හෙයකින් එකම තවානක පැල, බිම් කැබලි කීපයක් වගා කිරීමට යොදා ගත්තේ නම් අදාළ බිම් කැබැල්ල පිළිබඳව පමණක් තවාන සකස් කිරීම හා රැකබලා ගැනීම සඳහා වූ වියදම් විස්තර සපයන්න.

1.1 <u>බීජ වී</u> :

බිම් කැබැල්ලේ වගා කිරීම සඳහා තවාන් කිරීමට යොදාගත් බීජ වී ප්‍රමාණය තීර අංක 2 හි අදාළ ඒකකයන් සමග සටහන් කරන්න. මෙහිදී මතක තබා ගතයුතු වන්නේ බිම් කැබැල්ලේ වගාව සඳහා තවානෙන් යොදාගත් කොටසේ බීජ වී ප්‍රමාණය ඇතුලත් කිරීමටය.

<u>නිදසුන</u> : ගොවියකු බීජ කිලෝ ග්‍රෑම් 21 ක් තවාන් කර ඉන් ලද පැල වලින් අක්කර 1/2 සහ අක්කර 1/4 ක බිම් කැබලි දෙකක් වගා කළේ නම්, අක්කර 1/2 බිම් කැබැල්ලට අදාලව තොරතුරු සපයන විට බීජ වී ප්‍රමාණය ලෙස සඳහන් කළ යුත්තේ කි.ග්‍රෑම් 21.00 ක් නොව කි.ග්‍රෑම් 14.00 ක් බවය.

1.2 <u>තවාන් සඳහා බිම් සකස් කිරීම</u> :

සමහරක් තවාන් එළිමහනේ ද, සමහරක් මාගල් හෝ පැදුරු මත ඇතිරීමෙන් ද, සමහරක් ලී පෙට්ටි තුළ පස් දැමීමෙන් ද සකස් කෙරේ. එබැවින් තවාන සකස් කිරීම සඳහා විවිධ වූ ද්‍රව්‍ය සහ ශ්‍රමය වැය වන බැවින් අදාළ ද්‍රව්‍ය සහ ශ්‍රමය පිළිබඳ තොරතුරු අදාළ තීර යටතේ ඇතුලත් කරන්න.

1.3 <u>තවාන් සඳහා වී වැපිරීම</u> :

තවානේ වී වැපිරීම සඳහා ශ්‍රමය පමණක් උපයෝගී කර ගනී. එම විස්තර අදාළ තීර යටතේ දෙන්න.

1.4 <u>තවානට පොහොර යෙදීම</u> :

රසායනික පොහොර, ගොම පොහොර, කොළ පොහොර ආදී වශයෙන් තවාන් සඳහා කීප වර්ගයක පොහොර යොදනු ලැබේ. එම පොහොර වර්ග යෙදීම සඳහා උපයෝගී කර ගත් පොහොර ප්‍රමාණයන් සහ ශ්‍රමය පිළිබඳ විස්තර අදාළ තීරවල ඇතුලත් කළ යුතුයි.

1.5 <u>තවානේ වල් පැලෑටි මර්ධනය</u> :

තවානේ වල් පැලෑටි ඉවත් කිරීමක් කළේ නම්, බොහෝ විට කරන්නට ඇත්තේ වල් නාශක ඉසීමෙනි. එවිට එයට යොදාගත් රසායනික ද්‍රව්‍ය, ශ්‍රමය සහ ස්ප්‍රේයර් පිළිබඳ තොරතුරු අදාල තීරවල සපයන්න.

1.6 <u>තවානේ කෘමි මර්ධනය</u> :

තවාන සඳහා කෘමි නාශක භාවිතා කළේ නම් එම ප්‍රමාණයන් සහ යෙදීම සඳහා යොදාගත් ස්ප්‍රේයර් සහ ශ්‍රමය ද පිළිබඳ විස්තර අදාල තීරවල ඇතුලත් කරන්න.

1.7 <u>පැල සිටුවීම සඳහා පැල ඉදිරීම</u> :

බිම් කැබැල්ලේ පැල සිටුවීම සඳහා යොදා ගැනීමට තවානෙන් ගොයම් පැල ඉදිරීම සිදු කරනු ලැබේ. මේ සඳහා භාවිතා කරන ශ්‍රමය පිළිබඳ තොරතුරු අදාළ තීරවල ඇතුලත් කරන්න.

1.8 <u>වෙනත් (සඳහන් කරන්න...)</u>

ඉහත සඳහන් නොකරන ලද වෙනත් වියදම් තවාන් සකස් කිරීම හා බලාගැනීම යටතේ දරන්නට සිදුවූයේ නම් ඒ සඳහා යොදාගත් ද්‍රව්‍යය සහ ශ්‍රමය පිළිබඳ විස්තර අදාල තීරවල ඇතුලත් කරන්න.

2. <u>බිම් සකස් කිරීම</u>.

මෙහිදී කුඹුරේ වී වැපිරීමට හෝ පැල සිටුවීමට පෙර කරන කාර්යයන් වල විස්තර එක්රැස් කරනු ලැබේ.

2.1 <u>වල් පැලෑටි නාශක යෙදීම</u> :

බිම් සකස් කිරීම යටතේ සමහරු කරන පළමු කාර්යය වනුයේ වල් පැලෑටි නාශක යෙදීමයි. මේවා කුඹුරේ සහ නියර මත ද ඉසිනු ලබයි. මේ සඳහා වල් නාශක, ශ්‍රමය සහ ස්ප්‍රේයර් භාවිතා කරනු ලබන අතර ඒ සම්බන්ධ විස්තර අදාල තීර යටතේ ඇතුලත් කරන්න.

2.2 <u>බිම් ශුද්ධ කිරීම, නියර හා ඇලවේලි ඉදිකිරීම, බඩවැටි සකස් කිරීම සහ ජලය බැඳීම</u> :

කුඹුරේ වල් නාශක යෙදීමෙන් පසුව පළමු සීසෑමට ප්‍රථමයෙන් බිම් ශුද්ධ කිරීම (පුරන් කෙටීම), නියර රැකීම සහ බැඳීම, ඇලවේලි ශුද්ධ කිරීම හා බැඳීම, බඩවැටි සකස් කිරීම ආදිය කර කුඹුරට ජලය ඒමට සලස්වා ජලය බැඳීම කරයි. මෙම වැඩ කටයුතු වලදී උපයෝගී කර ගන්නා ලද ද්‍රව්‍ය, ශ්‍රමය, රෝද 4/රෝද 2 ට්‍රැක්ටර් සහ සතුන් (එළහරක්/මීහරක්) පිළිබඳ විස්තර අදාල තීරවල ඇතුලත් කළ යුතුයි.

2.3 <u>පළමු සීසෑම</u> :

ඉහත සඳහන් කාර්යයන් ගෙන් පසුව පළමු සීසෑම කරයි. පළමු සීසෑම කෙටීමෙන්, හරකුන්ගෙන් සහ ට්‍රැක්ටර් භාවිතයෙන් ද කරනු ලබයි. මේ සඳහා යොදාගනු ලබන ශ්‍රමය ට්‍රැක්ටර් රෝද 4/රෝද 2 සහ සතුන් (එළහරක්/මීහරක්) පිළිබඳ විස්තර අදාල තීරවල ඇතුලත් කළ යුතුයි. සාමාන්‍යයෙන් පළමු සීසෑම නිමවූ පසුව සති දෙකක් පමණ වතුර බැඳ තබනු ලබයි.

2.4 <u>දෙවන සීසෑම</u> :

පළමු සීසෑමට සති 2 කට පමණ පසුව එක්රැස් වී ඇති ජලය බැස යාමට හැර දෙවන සීසෑම කරනු ලබයි. මෙය උදැල්ලෙන් කෙටීමෙන්, හරකුන් යෙදීමෙන් සහ ට්‍රැක්ටර් මගින් කරනු ලබයි. මේ සඳහා උපයෝගී කරනු ලබන ශ්‍රමය, ට්‍රැක්ටර් රෝද 4/රෝද 2 සහ සතුන් (එළහරක්/මීහරක්) පිළිබඳ විස්තර අදාල තීරවල ඇතුලත් කරන්න. සමහර විට මෙම කාර්යයෙන් පසුව ද ජලය බැඳීම කරනු ලබයි.

2.5 <u>තෙවන සීසෑම</u> :

සමහර අවස්ථාවලදී දෙවන සීසෑම අවසාන වූ පසුව ද තවදුරටත් වල් පැලෑටි, කටු පඳුරු, ඉපැනැල් ඉතිරිව ඇත්නම් නැවත වරක් සීසෑම කරනු ලැබේ. මේ සඳහා යොදා ගන්නා ලද ශ්‍රමයද, ට්‍රැක්ටර් රෝද 4/රෝද 2 සහ සතුන් (එළහරක්/මීහරක්) පිළිබඳ විස්තර තෙවන සීසෑම යටතේ ඇතුලත් කරන්න.

2.6 <u>තියර මඩ තැබීම</u> :

වී වැපිරීම හෝ පැල සිටුවීමට ප්‍රථම කෙරෙන අවසාන කාර්යය වනුයේ මෙයයි. මෙම කාර්යය සඳහා යොදාගත් ශ්‍රමය පිළිබඳ විස්තර අදාල තීරවල ඇතුලත් කරන්න.

2.7 <u>මඩ කිරීම සහ මට්ටම් කිරීම</u> :

මෙහිදී කුඹුර මඩ කිරීම සහ මට්ටම් කිරීම කරයි. මේ සඳහා යොදාගත් ශ්‍රමය ට්‍රැක්ටර් රෝද 4/රෝද 2 සහ සතුන් (එළහරක්/මීහරක්) පිළිබඳ විස්තර අදාල තීරවල ඇතුලත් කළ යුතුයි.

2.8 <u>පෝරු ගෑම (හැරෝ කිරීම)</u> :

කුඹුරු මඩ කිරීම සහ මට්ටම් කිරීමෙන් පසුව එක්රැස් වී ඇති ජලය බැස යාමට සලස්වා පෝරු ගෑම (හැරෝ කිරීම) කරනු ලබයි. මෙහිදී කැට පොඩි කිරීමේ කටයුතු ද කරනු ලබයි. මේ සඳහා යොදාගනු ලබන ශ්‍රමය, ට්‍රැක්ටර් රෝද 4/රෝද 2 සහ සතුන් (එළහරක්/මීහරක්) පිළිබඳ විස්තර අදාල තීරවල ඇතුලත් කළ යුතුයි.

2.9 <u>පොහොර යෙදීම</u> :

බිම් සකස් කිරීම යටතේ වී වැපිරීම/පැල සිටුවීමට ප්‍රථම කෙරෙන අවසාන කාර්යය වනුයේ මූලික පොහොර යෙදීමය. මූලික පොහොර ඓන්ද්‍රිය සහ රසායනික යනුවෙන් වර්ග දෙකකට බෙදා ඇත. මේ එක් එක් වර්ගය යටතේ යොදාගත් පොහොර සහ ශ්‍රමය වෙන වෙනම අදාල තීර යටතේ සටහන් කරන්න.

3. වැපිරීම/පැල සිටුවීම/පේලියට බීජ දැමීම සහ වෙනත්.

කුඹුරුවල වී වගා කිරීම නොයෙක් ආකාරවලට කරනු ලැබේ. එනම් වැපිරීමෙන්, අහඹු ලෙස හෝ පේලියට පැල සිටුවීම, යන්ත්‍ර මගින් පැල සිටුවීම සහ පෙලට බීජ දැමීම හා වෙනත් ආකාර වලටය. මේ පිළිබඳ විස්තර වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න.

කුඹුර වගා කළේ වී වැපිරීමෙන් හෝ පෙලට බීජ දැමීමේ ක්‍රමයට නම් බීජ වී යොදාගත් ප්‍රමාණයත් ඒ වෙනුවෙන් යොදවන ලද ශ්‍රමය සහ යොදාගත් යන්ත්‍ර පිළිබඳ විස්තර අදාල තීරවල ඇතුලත් කරන්න. අහඹු ලෙස හෝ පේලියට පැල සිටුවීම සහ යන්ත්‍ර මගින් පැල සිටුවීමට පැල පිටතින් ලබාගත්තේ නම් ඒ පිළිබඳව ද යොදාගත් ශ්‍රමය සහ යන්ත්‍ර පිළිබඳ විස්තර ද ඇතුලත් කරන්න. පැල ලබාගත්තේ තමන්ගේම තවානෙන් නම් එම විස්තර මෙහි ඇතුලත් කළ යුතු නැත.

4. වී වගා කිරීමෙන් පසු පොහොර යෙදීම.

වී වගා කිරීමෙන් පසුව විවිධ පොහොර වර්ග භාවිතා කරනු ලැබේ. යූරියා 1 වන යෙදීම, යූරියා 2 වන යෙදීම හා වෙනත් පොහොර කාබනික (ගොම පොහොර, කොළ පොහොර, කැට පොහොර) සහ රසායනික පොහොර යෙදීම් ආදී වශයෙන් වර්ග කීපයක් වේ. ඒ ඒ වර්ග යටතේ යොදා ගන්නා ලද පොහොර ප්‍රමාණය සහ ශ්‍රමය පිළිබඳ විස්තර අදාල තීරවල ඇතුලත් කරන්න.

5. වල් පැලෑටි මර්දනය.

වල් නාශක මර්දනය, අතින් හෝ රසායනික ක්‍රම වලින් යනුවෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. වල් පැලෑටි මර්දනය අතින් කරන්නේ නම් ඉදිරීමෙන් ද, රසායනික ක්‍රමයට කරනවා නම් වල් නාශක යෙදීමෙන් ද කරනු ලබයි. මෙහිදී යොදාගත් වල්නාශක, ශ්‍රමය හා ස්ප්‍රේයර් පිළිබඳ විස්තර අදාල තීරවල ඇතුලත් කරන්න.

6. කෘමි සහ දිලීර මර්දනය.

මෙහිදී සඳහන් කළ යුත්තේ ගොයමට හානි කරන කෘමීන් මර්දනය පිළිබඳ විස්තරය. කෘමීන් මර්දනය කෘමිනාශක ද්‍රව්‍ය භාවිතයෙන් හෝ වෙනත් ක්‍රම මගින් සිදු කළා විය හැකිය. ඒ සඳහා යොදාගත් කෘමි/දිලීර නාශක ද්‍රව්‍ය, ශ්‍රමය සහ ස්ප්‍රේයර් පිළිබඳ විස්තර අදාල තීරවල ඇතුලත් කරන්න.

7. ජල සැපයුම.

කුඹුරට ජලය සපයා ගැනීමේදී යොදවාගනු ලබන ශ්‍රමය සහ වතුර පොම්ප පිළිබඳ විස්තරද මෙහි අදාල තීරවල ඇතුලත් කළ යුතුයි.

8. **කුරුල්ලන්ගෙන් හා සතුන්ගෙන් ආරක්‍ෂා කිරීම.**

ගොයම් කුරුල්ලන්ගෙන් සහ සතුන්ගෙන් ආරක්‍ෂා කිරීම සඳහා යොදාගන්නා ලද ද්‍රව්‍ය සහ ශ්‍රමය පිළිබඳ විස්තර මේ යටතේ සැපයිය යුතුය. තුවක්කු, වෙඩි බෙහෙත්, රතිඤ්ඤා, ගිනිමැල සඳහා යොදන ලද දර, ඉන්ධන, විදුලි බලය, විදුලි පන්දම් ආදි විස්තර ද්‍රව්‍යය යටතේ තීරුවල සඳහන් කළ යුතු අතර කම්කරුවන් පිළිබඳව විස්තර ශ්‍රමය යටතේ තීරුවල ද ඇතුලත් කරන්න.

9. **අස්වනු නෙලීම.**

ගොයම් කැපීම, ඇදීම, පෑගීම සහ හුළං කිරීම යනුවෙන් ප්‍රධාන කොටස් හතරකට අස්වනු නෙලීම බෙදිය හැකියි. මේ සඳහා යොදාගත් ශ්‍රමය, ට්‍රැක්ටර් සහ යන්ත්‍ර පිළිබඳ තොරතුරු වෙන් වෙන්ව අදාල තීර යටතේ සඳහන් කළ යුතුය.

10. **ගොවිපල අමතර වියදම්.**

ඉහත සඳහන් නොවූනු ඉන්ධන, ජලබදු, අත්තර බදු/බිම් කුලී/බදු කුලී, වගා රක්‍ෂණ, ප්‍රවාහණ වියදම්, නඩත්තු වියදම්, ඇහුරුම් ද්‍රව්‍ය හා වෙනත් දේ සඳහා වන වියදම් පිළිබඳ විස්තර මේ යටතේ සැපයිය යුතුයි.

ඉන්ධන සඳහා වියදම් යටතේ ගැනෙනුයේ අදාල බිම් කැබැල්ලේ වැඩ සඳහා යොදාගත් තමාගේම, ඉල්ලාගත් හෝ කුලියට ගත් ට්‍රැක්ටර් සහ අනෙකුත් යන්ත්‍රෝපකරණ සඳහා යොදාගත් පෙට්‍රල්, ඩීසල්, ලිහිස්සි තෙල් ආදිය සඳහා ගිය වියදම් වේ. මෙහිදී වාහනයක් හෝ යන්ත්‍රෝපකරණයක් කුලියට ගත්තේ නම්, එය වෙනුවෙන් ඉන්ධන මිලට ගෙන යොදා ඇත්නම් පමණක් එම ප්‍රමාණයේ වටිනාකම මෙහි ඇතුලත් කළ යුතු අතර එම වාහනය හෝ යන්ත්‍රය සඳහා ගෙවන ලද කුලියක් වේ නම් එය යොදාගත් කාරියය යටතේ ඇතුලත් කරන්න. තවත් සමහර අවස්ථාවලදී ඉන්ධන වගී කෘමි/දිලීර මර්ධන, වල් පැලෑටි මර්ධන ආදි කාරියයන් සඳහා යොදා ගන්නා විටදී මෙම කොටස යටතේ නොව ඒ ඒ අදාල කාරියය යටතේ ඇතුලත් කරන්න.

ප්‍රවාහණ වියදම් යටතේ වී ගබඩා කර ඇති ගෘහ ඒකකයේ සිට හෝ කමතේ සිට වෙළඳ පොලට ගෙනයාම සඳහා වන ප්‍රවාහණ වියදම් හැර අනෙකුත් සියලුම ප්‍රවාහන වියදම් ඇතුලත් කරන්න. එනම් පොහොර ප්‍රවාහණය, බීජ වී ප්‍රවාහණය, වී අස්වැන්න කුඹුරේ සිට කමතට/ගබඩා ස්ථානයට ප්‍රවාහණය යනාදී ප්‍රවාහණ වියදම් ප්‍රවාහණ වියදම් යටතේ ඇතුලත් කරන්න.

නඩත්තු වියදම් යටතේ අදාල කැබැල්ලේ කාණු කැපීම්, ගල් වැටි දැමීම්, වැටවල් බැඳීම් ආදි අළුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම් ද යොදාගත් ට්‍රැක්ටර් සහ අනෙකුත් යන්ත්‍රෝපකරණ සඳහා වගා කන්නය තුලදී කරන ලද සියලුම අළුත්වැඩියා සහ නඩත්තු කිරීම් මෙහි ඇතුලත් කළ යුතුයි. වෙන් වෙන් වශයෙන් සඳහන් කළ නොහැකි වෙනත් වියදම් වේ නම් වෙනත් යටතේ සඳහන් කර ඇතුලත් කරන්න.

11. <u>යොදාගත් අනෙකුත් මෙවලම් සහ උපකරණ.</u>

ට්‍රැක්ටර් රෝද 4/රෝද 2, ස්ප්‍රේයර්, කොළ මඩින යන්ත්‍ර, වී හුලං කරන යන්ත්‍ර, ගොයම් කපන යන්ත්‍ර, වතුර පොම්ප, බීජ ඉසින යන්ත්‍ර හා මීහරක්, ගවයන් වැනි සතුන් ආදිය හැරුණු කොට, සෙසු මෙවලම් හා උපකරණ වන උදලු, දෑකැති, මුල්ලු, කගුල් යනාදිය මෙම කොටසට අයත් වේ.

යොදාගත් ගණන, අදාල කන්නයේදී අයිතමයක් සාමාන්‍යයෙන් පාවිච්චි කළ දින ගණන, අයිතමයේ වර්තමාන වෙළඳ පොළ මිළ සහ සාමාන්‍යයෙන් පාවිච්චි කළ හැකි කාලය (කන්න ගණන) පිළිබඳ විස්තර මෙහිදී එක්රැස් කරනු ලැබේ.

<u>තීරු අංක 2 - යොදාගත් ගණන.</u>

මෙහිදී අදාල කැබැල්ල සඳහා යොදාගත් මුළු අයිතම ගණන ඒ ඒ අයිතමය යටතේ ඇතුලත් කළ යුතුයි. මෙහිදී තමාට අයත්, ඉල්ලාගත්, කුලියට ගත් ආදී සෑම ආකාරයකින්ම ලබාගන්නා ලද අයිතම ගණන ඇතුලත් විය යුතුයි.

<u>තීරු අංක 3 - අදාල කන්නයේදී අයිතමයක් සාමාන්‍යයෙන් පාවිච්චි කළ දින ගණන.</u>

අදාල කැබැල්ලේ තීරු අංක 1 යටතේ සඳහන් අයිතමයන් වෙනුවෙන් තීරු අංක 2 පිරවී ඇත්නම් එම යොදාගත් අයිතම අතුරින් සාමාන්‍යයෙන් එක් අයිතමයක් අදාල කන්නය තුළදී පාවිච්චි කළ දින ගණන මෙහි ඇතුලත් කරන්න. උදාහරණයක් වශයෙන් තීරු අංක 2 උදලු යටතේ 10 ක් සටහන් වී ඇත්නම්, එක් උදැල්ලක් අදාල කන්නයේදී පාවිච්චි කළ <u>සාමාන්‍ය දින ගණන</u> මෙහි ඇතුලත් කළ යුතුයි. මෙය ඔබ විසින් ගණනය කළ යුත්තක් වන අතර, ඒ සඳහා ගොවියා ඒ එක් එක් උදැල්ල පාවිච්චි කළ දින ගණන් අසා එහි සාමාන්‍ය අගයන් යොදාගත හැකියි.

<u>තීරු අංක 4 - සාමාන්‍යයෙන් පාවිච්චි කළ හැකි කාලය (කන්න ගණන)</u>

තීරු අංක 1 හි සඳහන් අයිතමයන් සාමාන්‍යයෙන් පාවිච්චි කළ හැකි කාලය එනම් ආයු කාලය කන්න ගණනින් මෙහි ඇතුලත් කරන්න.

<u>මුළු අස්වැන්න ප්‍රමාණය.</u>

අදාල කැබැල්ලේ ගොයම් කපා, පාගා, හුලංකර ලබාගත් අස්වැන්නේ ප්‍රමාණය බුසල් වලින් මෙහි සඳහන් කරන්න.

<u>විකුණූ ප්‍රමාණය.</u>

ඉහත සඳහන් කරන ලද බිම් කැබැල්ලට අයත් අස්වැන්නෙන් විකුණන ලද ප්‍රමාණයක් වේ නම්, එහි ඒකකය, ප්‍රමාණය සහ ඒකකයක විකුණුම් මිළ මෙහි ඇතුලත් කරන්න.